මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission

මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :**PE/2024/67** **2024.11.10**

## පාර්ලිමේන්තු මැතිවරණය - 2024 නොවැම්බර් 14
## අවසරලත් නිවේදිත ඡන්ද කාර්යාල ඉවත් කිරීම

නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සහතික කරනු වස් නිවේදිත ඡන්ද කාර්යාල සම්බන්ධයෙන් පහත කරුණුවලට අනුකූලතාව දැක්වීමෙන් සහාය වන ලෙස සියලුම අපේක්ෂකයන්, ඡන්ද නියෝජිතයන්, බලයලත් නියෝජිතයන්, ප්‍රාදේශීය නියෝජිතයන් හා ඔවුන්ගේ ආධාරකරුවන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

1. නිවේදිත කාර්යාල පවත්වා ගෙන යාමේ කාලසීමාව.

| කාර්යාල වර්ගය | කාර්යාලය පවත්වාගෙන යා හැකි කාල සීමාව |
|---|---|
| ඡන්ද කොට්ඨාස මට්ටමින් පිහිටුවා ඇති නිවේදිත ශාඛා මැතිවරණ කාර්යාල | **2024.10.04** දින සිට**2024.11.12** දින මධ්‍යම රාත්‍රිය දක්වා |
| එක් එක් මැතිවරණ කොට්ඨාස මට්ටමින් පිහිටුවන නිවේදිත ශාඛා මැතිවරණ කාර්යාල * | **2024.11.13** දින සිට **2024.11.15** වන දින මධ්‍යම රාත්‍රිය දක්වා |
| මැතිවරණ කොට්ඨාස බල ප්‍රදේශ මට්ටමින් පිහිටුවා ඇති නිවේදිත මධ්‍ය මැතිවරණ කාර්යාල | **2024.10.04** දින සිට **2024.11.15** දින මධ්‍යම රාත්‍රිය දක්වා |
| අපේක්ෂකයාගේ/ බලයලත් නියෝජිතයාගේ/ ස්වාධීන කණ්ඩායම් නායකගේ සාමාන්‍ය පදිංචි නිවස කාර්යාලය ලෙස යොදා ගෙන තිබේ නම් | **2024.10.04** දින සිට **2024.11.15** දින මධ්‍යම රාත්‍රිය දක්වා |

* මෙම කාර්යාල ආරම්භ කළ යුතු දිනය **2024.11.13** වේ.

2. ප්‍රචාරක කටයුතු පවත්වා ගෙන යාම;

- ඡන්ද කොට්ඨාස මට්ටමින් දැනට පිහිටුවා ඇති අවසරලත් නිවේදිත ඡන්ද කාර්යාලවල, මැතිවරණ කොට්ඨාස මට්ටමේ මධ්‍යගත කාර්යාලවල, ඡන්ද ප්‍රදේශ කාර්යාලවල හෝ වෙනත් අවසරලත් නිවේදිත ඡන්ද කාර්යාලයක වුවද එම කාර්යාල හැඳින්වීම සඳහා වූ වර්ග අඩි 60 නොඉක්ම වූ ප්‍රචාරක පුවරුව හැර අන් සියලු ප්‍රචාරක පුවරු, පෝස්ටර් හෝ සැරසිලි ප්‍රදර්ශන, අපේක්ෂකයා ගමන් ගන්නා වාහනයේ ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීම් හා වෙනත් කිසිදු අයුරක ප්‍රචාරක කටයුතු **2024.11.11** දින මධ්‍යම රාත්‍රියෙන් පසු සිදු නොකළ යුතු ය.

**2024.11.12** දින පෙරවරුවේ ඉහත උපදෙස්වලට පටහැනිව පවත්වා ගෙන යනු ලබන කාර්යාල පරීක්ෂා කිරීමට දිස්ත්‍රික්/ ප්‍රාදේශීය පැමිණිලි කළමනාකරණ ඒකකවල පොලිස් නිලධාරීන්ගෙන් හා විමර්ශන නිලධාරීන්ගෙන් සමන්විත කණ්ඩායම් පැමිණෙනු ඇත. අවසරලත් නිවේදිත පක්ෂ කාර්යාලවල ඇති ප්‍රචාරක පුවරු ඉවත් කරවීම නොවැම්බර් මස **12** දින සිට සිදු කරන අතර, ඡන්ද විමසීම් නීතියට අනුකූල නොවන ලෙස පවත්වාගෙන යන කාර්යාල වෙතොත් ඒවා ඉවත් කිරීමටද පියවර ගනු ලැබේ.

ආර්.එම්.ඒ.එල්.රත්නායක
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි)